# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/13 - 2014 මැයි මස 06 වැනි අඟහරුවාදා - 2014.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### දකුණු පළාතේ පළාත් සභාව

#### දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආ)(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දකුණු පළාතේ ආණ්ඩුකාරවර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය වන මම, දකුණු පළාතේ හත්වැනි පළාත් සභාවේ ප්‍රථම සැසි වාරය 2014ක් වූ මැයි මස 20 වැනි දින පෙ. ව. 10.00ට දකුණු පළාතේ පළාත් සභා, සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන බව මෙයින් නිවේදනය කරමි.

නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2014ක් වූ අප්‍රේල් මස 24 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ දී ය.

05-612/1

---

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### දකුණු පළාතේ පළාත් සභාව

#### දකුණු පළාතේ ආණ්ඩුකාරවර විසින් කරන ලබන පත්කිරීම්

දකුණු පළාත් ආණ්ඩුකාරවර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය යටතේ අංක 154(ඊ)(5) වැනි ව්‍යවස්ථාව අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු හත්තොටුව ගමගේ වීරසුමන වීරසිංහ මැතිතුමා විසින් දැනට දරන දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස් බල හා රැකී රක්ෂා යන අමාත්‍යාංශ විෂයයන් වලට අමතරව ග්‍රාම සංවර්ධන විෂය ද 2014.04.24 දින සිට පවරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2014ක් වූ අප්‍රේල් මස 24 වැනි දින,
ඩික්සන් පාරේ,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05-612/2


1A - PG 002050 — 25 (2014/05)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලබන පත්කිරීම්

දකුණු පළාත් ආණ්ඩුකාරවර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය යටතේ අංක 154(ඊ)(5) වැනි ව්‍යවස්ථාව අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක මැතිතුමා විසින් දැනට දරන දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන, සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ සමූපාකාර සංවර්ධන යන අමාත්‍යාංශ විෂයයන් වලට අමතරව වෙළඳ විෂය ද 2014.04.24 දින සිට පවරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2014ක් වූ අප්‍රේල් මස 24 වැනි දින,
ගාල්ල,
ඩික්සන් පාරේ,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05-612/3

---

## දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාත් ආණ්ඩුකාරතුමිය විසින් කරන ලබන පත්කිරීම්

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය මැතිණිය විසින් පහත සඳහන් පත්කිරීම් සිදුකිරීම අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ චින්තක එස්. ලොකුහෙට්ටි මහතා ලේකම් ධූරය දරන දකුණු පළාත් සභාවේ, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස් බල හා රැකී රක්ෂා යන අමාත්‍යාංශ විෂයයන් වලට අමතරව 2014.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාම සංවර්ධන විෂයෙහි ලේකම්වරයා වශයෙන්.

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ සුමිත් අලහකෝන් මහතා වැඩබලන ලේකම් ධූරය දරන දකුණු පළාත් සභාවේ, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයීම හා බෙදාහැරීම් සහ සමූපකාර සංවර්ධන යන අමාත්‍යාංශ විෂයයන් වලට අමතරව 2014.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙළඳ විෂයෙහි වැඩබලන ලේකම්වරයා වශයෙන්.

ලාල් සමරසේකර,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්.

2014ක් වූ අප්‍රේල් මස 24 වැනි දින,
ගාල්ල,
ඩික්සන් පාරේ,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

05-612/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.